# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1815/17 – 2013 ජූනි 20 වැනි බ්‍රහස්පතින්දා – 2013.06.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩපනේ කෝරළේ සුළු කොට්ඨාසයේ, පූඩළුඔය ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක එන්යූ/කෝටීඑම්/2011/23 හා 2011.08.09 දිනැති ප්‍රගමන අනුරේඛනයේ ප්‍රමාණයෙන් හෙක්. 0.0090ක් වූ කැබලි අක්ෂර ''ඒ'' ලෙස දක්වා ඇති ඉඩම් කොටසට මායිම්:

01. කැබලි අක්ෂර ''ඒ'' – වොයිසි වත්ත – ප්‍රමාණය : හෙක්. 0.0090

උතුරට: මු.පි.නු. 2675හි කැබලි අංක 02, 01 සහ වොයිසිවත්ත (හිපි 50066); නැගෙනහිරට සහ දකුණට: වොයිසිවත්ත (හිපි 50066); බටහිරට: මු.පි.නු. 2675හි කැබලි අංක 02 සහ 01.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

අමා. යොමු අංකය: 4/3/12/2010/සීඊබී/204.
ප්‍රා.ලේ. යොමු අංකය: 3/2/6/4/1/24.
2013 ජූනි මස 14 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
ඉඩම් මහලේකම් කාර්යාලය, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

07 - 101

1A – G 17823 – 325 (2013/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*